**කල්මුණේ මහ නගර සභාව**
**අම්පාර දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව සහ විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 මැයි 29 දින සභාවට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2019 දෙසැම්බර් 31 දිනට කල්මුණේ මහ නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**(අ) ගිණුම්කරණ ප්‍රතිපත්ති**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහ අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව්කො නොතිබුණි. | ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව්කළ යුතු වේ. | මෙම වසරේ සිට මූල්‍ය ප්‍රකාශන සකස්කිරීමේදි අනුගමනය කරන ගිණුම්කරණ ප්‍රතිපත්ති සම්බන්ධයෙන් අවධානය යොමු කරමි. |

**(ආ) ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සන අපද්‍රව්‍ය බැහැර කිරීම වෙනුවෙන් 2011 – 2015 කාල පරිච්ඡේදයට අදාල කරෙයිතීවු ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතු ගාස්තු රු.3,023,329 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | ගෙවිය යුතු මුදල් මූල්‍ය ප්‍රකාශනවල වගකීමක් වශයෙන් ඇතුලත් කළ යුතු වේ. | මේ සම්බන්ධයෙන් අවශ්‍ය ලියවිලි සහ විස්තර කරෙයිතිවු ප්‍රාදේශීය සභා විසින් අප වෙත දන්වා නොතිබුණි. එම නිසා මේ සම්බන්ධයෙන් අවධායන යොමුවී නොතිබුණි. කෙසේ වෙතත් සමාලෝචිත කාල පරිච්ඡේදයේ රු.500,000 ක් ගෙවන ලදි. |

| | | | |
|---|---|---|---|
| (ii) | 2018 වර්ෂයට අදාලව බයිසිකල් ආරක්ෂා කිරීමේ බදු ආදායම් වශයෙන් අයවිය යුතු රු.450,000 ක් ගිණුම්වල දක්වා නොතිබුණි. | අයවිය යුතු ආදායම් මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කළ යුතු වේ. | අදාල හිඟ මුදලින් අයකර ගත හැකි ප්‍රමාණය අයකර ගැනීමටත් ඉතිරි මුදල අවශ්‍ය අනුමැතිය ලබා ගෙන කපා හැරීමටත් කටයුතු කර ඇත. |
| (iii) | 2018 වර්ෂයේ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයේ නිර්දේශය අනුව සමාලෝචිත වර්ෂයේ විනාශ කරන ලද භාණ්ඩ 199 ක පුස්තකාල පොත් 1,240 ක් හා රු.155,595 කට විකුණන ලද භාණ්ඩ වර්ග 82 ක වටිනාකම මූල්‍ය ප්‍රකාශනවලින් ඉවත්කර නොතිබුණි. | ඉවත් කරන ලද භාණ්ඩවල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල ගැලපිය යුතු වේ. | මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී අඩුකළ වටිනාකම නිවැරදිව නොලැබුණු හෙයින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයේ අඩුකර නොතිබුණි. ඉදිරි මූල්‍ය ප්‍රකාශනයේ නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (iv) | ස්ථාවර තැන්පත් රු.මිලියන 32 ක් වෙනුවෙන් ලැබිය යුතු පොලී මුදල රු.මිලියන 4 ක් ආදායමක් වශයෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | පොලී ආදායම් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතු වේ. | තැන්පත් මුදල සමඟ එකතු කර ඇත. |

**(ඇ) නොසැසඳුණු ගිණුම්**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| ආදායම් ගිණුම් 07 කට අදාල ශේෂයන් සහ ලේඛන අනුව ශේෂයන් අතර එකතුව රු.39,399,166 ක නොසැසඳීම් විය. | ගිණුම් සසඳා නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. | නිවැරදි කිරීමට කටයුතු කරන්නෙමි. |

**(ඇ)** විගණනය සඳහා අවශ්‍ය **ලිඛිත සාක්ෂි නොමැතිවීම**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| රු.119,239,000 ක් වටිනා ඉඩම් හා ගොඩනැගිලි සඳහා ඉඩම් ඔප්පු හා ස්ථාවර වත්කම් ලේඛනය විගණනය ඉදිරිපත් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ශේෂයන් සනාථ කර සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ. | ඉඩම් සඳහා ඔප්පු ලැබී නොතිබුණි. |

## 1.4 අනුකූල නොවීම්

-------------------

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

-----------------------------------------------------------------------

| නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | මහා නගර සභා ආඥා පනතේ වගන්තිය 218 | එක් එක් මුදල් වර්ෂය වෙනුවෙන් පිළියෙල කළයුතු පරිපාලනය පිළිබඳ විස්තරාත්මක වාර්තාව සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පිළියෙල කර නොතිබුණි. | අදාල පනත අනුව පිළියෙල කිරීමට කටයුතු කළ යුතු වේ. | මෙය නගරාධිපතිගේ කාර්යයකි. ඉකුත් කාලවල මෙවැනි වාර්තා නගරාධිපතිවරුන් විසින් පිළියෙල කර බවට දැනුවත් විය නොතිබුණි. කෙසේවෙතත් දැනට නගරාධිපති විසින් ඉදිරියේදි මෙවැනි වාර්තා පිළියෙල කර ඉදිරිපත් කරන බව දන්වා සිටිමි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි 571 | වර්ෂ දෙකක් ඉක්ම වූ රු.28,323,057 ක් වටිනා තැන්පත් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතු වේ. | ආදායම් ගිණුමට මාරු කිරීමට කටයුතු කර ඇත. |

## 2. මූල්‍ය සමාලෝචනය

----------------------

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

-----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.18,437,411 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.4,843,893 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

-----------------------

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

----------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2019 ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2018 ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|
| | රු.'000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| වරිපනම් හා බදු | 11,100 | 21,231 | 25,460 | 90,465 | 11,100 | 12,349 | 9,222 | 94,693 |
| කුලී | 19,980 | 17,623 | 17,202 | 39,544 | 19,980 | 15,592 | 15,261 | 39,123 |
| බලපත්‍ර ගාස්තු | 9,705 | 10,868 | 10,868 | -- | 9,705 | 8,491 | 8,491 | -- |
| වෙනත් ආදායම් | 45,275 | 56,725 | 55,455 | 1,269 | 45,275 | 34,435 | 34,435 | -- |
| | **86,060** | **106,447** | **108,985** | **131,278** | **86,060** | **70,867** | **67,409** | **133,816** |

### 2.2.2 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මහ නගර සභා ආඥා පනතේ 252(1)(ආ) වගන්තිය අනුව මහ නගර සභා බල ප්‍රදේශයේ නිශ්චල දේපල සහ ඉඩම් 47,900 කින් වර්ෂයට අධික කාලයක සිට අයවිය යුතු වරිපනම් බදු රු. මිලියන 91.6 ක් අයකර නොතිබුණි. | අදාල කාලයතුල හිඟ මුදල අයකිරීමට කටයුතු කළ යුතු වේ. | අදාල පුද්ගලයන්ට කාලීනව දැන්වීම් ලබා දී හැකි පමණ මුදලක් අයකර ගැනීමට කටයුතු කර ඇති අතර, 2019 වර්ෂයේ රු. 24,228,718 ක් අයකර ඇත. |

### 2.2.3 කුලී

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 1987 සිට හිඟව පවතින මහජන පොල බදු රු.12,314,393 ක්, මස්කඩ බදු රු.7,661,912 ක් හා කඩ කුලී රු.13,657,443 ක් අයකිරීමට හෝ පොත්වලින් කපා හැරීමට කටයුතු නොකර දිගටම මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | අයකිරීමට හෝ සුදුස්සක් කිරීමට කටයුතු කළ යුතු වේ. | කපා හැරීමට කටයුතු කරනු ලැබේ. |
| (ආ) | 1996 සිට හිඟව පවතින බයිසිකල් සහ වාහන ආරක්ෂක බදු රු.3,394,613 ක් අයකර ගැනීමකින් තොරව දිගටම මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | අයකිරීමට හෝ සුදුස්සක් කිරීමට කටයුතු කළ යුතු වේ. | කපා හැරීමට කටයුතු කරනු ලැබේ. |
| (ඇ) | පොදු වෙළඳ පොලෙහි තිබෙන කඩකාමර 64 ක හිඟය රු.5,130,143 ක් වර්ෂ 8 කට වඩා වැඩි කාලයක සිට අයකරගෙන නොතිබුණි. | අයකිරීමට හෝ සුදුස්සක් කිරීමට කටයුතු කළ යුතු වේ. | මෙම කඩ කාමර අළුත්වැඩියා කිරීමට ඇතිබැවින් හිඟ මුදල අයකිරීම් දුෂ්කර වී ඇත. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | මහජන පොලට යාබදව තිබෙන පුද්ගලික කඩ කාමර වල කඩ කුලිය මසකට රු. 10,000 සිට රු. 20,000 දක්වා පරාසයක පැවතිය ද, මෙම කඩ කාමර අලුතින් මිල ගණන් කැඳවීමකින් තොරව 1980 වර්ෂයේ සිට මාසිකව රු.500 සිට රු.4,000 ක් දක්වා පරාසයේ කුලියට දී තිබීමෙන් සභාවට වාර්ෂිකව රුපියල් මිලියන 60 ක පමණ ආදායමක් අහිමි වී තිබුණි. | ටෙන්ඩර් කිරීමෙන් නව බදුකරුවන් සොයාගත යුතු වේ. | 2020 වර්ෂයේ සිට කුලි වැඩිකර ඇත. |
| (ඉ) | 2019 වර්ෂයට අදාල පොදු වෙළඳපොළ හිඟ බදු, මාළු වෙළඳ පොළ හිඟ බදු සහ රථ ගාල හිඟ පිළිවෙලින් රු.1,310,750 ක්, රු.276,000 ක් සහ රු.1,218,100 ක් අයකර ගෙන නොතිබුණි. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී හිඟ මුදල අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. |

### 2.2.4 මුද්දර ගාස්තු
-------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| නැගෙනහිර පළාත් සභාවේ 2010 වර්ෂයේ අංක 06 දරන මුද්දර බදු සංශෝධන 03 අනුව වාර්ෂිකව මුද්දර බදු අයකර ගත යුතු වුවද, 2018 සහ 2019 වර්ෂය සඳහා කල්මුණේ දිස්ත්‍රික් ඉඩම් රෙජිස්ටාර් දෙපාර්තමේන්තුවෙන් සහ නැගෙනහිර පළාත් ආදායම් දෙපාර්තමේන්තුවෙන් අයකරගත් මුද්දර ගාස්තු ගණනය කර අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2018, 2019 වර්ෂය සඳහා අදාල මුද්දර ගාස්තු අයකර ගත යුතු වේ. | 2019 වර්ෂයට අදාල මුද්දර ගාස්තු විස්තර දිස්ත්‍රික් රෙජිස්ටාර් කාර්යාලයෙන් ලබා ගැනීමේ අපහසුතාවයන් දක්නට ලැබේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය
---------------------------

### 3.1 කාර්යසාධනය
---------------

මහ නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විවරණය, පහසුව හා සුභසාධන යන සභාව විසින් ඉටුකළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම් පිළිබඳව අනාවරණයවූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා
-----------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මහනගර සභා ආඥා පනතේ 272 වගන්තිය අනුව ප්‍රධාන කාරණා 20 ක් සඳහා අතුරු ව්‍යවස්ථා පැනැවිය යුතුව තිබූ නමුත්, 2019 දෙසැම්බර් 31 දින දක්වා අතුරු ව්‍යවස්ථා පනවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා පනවා ගත යුතු වේ. | පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතියට යවා ඇත. |

(ආ) **ක්‍රියාකාරි සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මක් සකස් කළ යුතු වේ. | ඉදිරියේදි අවශ්‍ය කටයුතු කරනු ලැබේ. |

(ඇ) **ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2007 වර්ෂයේ Italian Overseas ආයතනයෙන් ඉදිකරන ලද ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානය ඉදි කළ දින සිට ප්‍රතිචක්‍රීකරණ කිසිවක් සිදුවී නොතිබුණි. | ප්ලාස්ටික් ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානය කාර්යක්ෂමතාවයෙන් ප්‍රයෝජනයට ගැනීමට ක්‍රියාකළ යුතු වේ. | පොහොර නිෂ්පාදන මධ්‍යස්ථානයේ පොහොර නිෂ්පාදන සඳහා ද ප්‍රතිචක්‍රීකරනය සඳහා ද අපද්‍රව්‍ය වර්ගී කරන කිරීමේදි ප්ලාස්ටික් ප්‍රමාණවත් පරිදි නොතිබීමෙන් පොහොර නිෂ්පාදන මධ්‍යස්ථානයට රැස්කරනු ලබන ඝණ අපද්‍රව්‍ය ගෙනයාම සඳහා පාරවල් පිළිවෙලට නොතිබීමත් ප්‍රධාන මාර්ගයේ අපගේ වාහන ගෙනයාමට නොහැකිවීම නිසා ප්‍රතිචක්‍රී කරන යන්ත්‍ර අඩුවෙන් යෙදවීමට සිදුවී ඇත. දැනට මෙය නිවැරදි කර ක්‍රියාත්මක කර ඇත. |

(ඈ) **තිරසාර සංවර්ධන ඉලක්ක**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2017 අංක 19 දරන තිරසාර සංවර්ධන පනත අනුව 2030 වර්ෂයේ එක්සත් ජාතින්ගේ න්‍යාය පත්‍රයට අනුකූල වන පරිදි සෑම පොදු ආයතනයක්ම ක්‍රියා කළ යුතු වුවත්, මේ සම්බන්ධ ඉලක්ක හඳුනාගෙන ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉලක්ක හඳුනාගෙන එය මැනීම් සඳහා දර්ශක ඇතිකර ඒවා ලඟා කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | මෙම කරුණු සම්බන්ධයෙන් නගරාධිපතිතුමාගේ අවධානයට යොමු කර ඇත. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | කාර්යාල ගොඩනැගිල්ල, මහජන පුස්තකාල මහජන පොල, ක්‍රීඩා පිටිය, රථ ගාල, පොහොර ප්‍රතිචක්‍රීකරන මධ්‍යස්ථානය සහ සාතකාගාර පිහිටා තිබෙන ඉඩම්වල අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදාල ඉඩම්වල අයිතිය පවරා ගැනීමට සඳහා කටයුතු කළ යුතු වේ. | මේ සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කර ඇත. |
| (ආ) | මොටර් වාහන සහ යන්ත්‍ර 37 ක අයිතිය පවරා ගෙන නොතිබුණි. | මෝටර් වාහන සහ යන්ත්‍රවල අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතු වේ. | වාහනවල අයිතිය පවරා ගැනීමට කටයුතු කර ඇත. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අනුමත කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 48 ක් හා අතිරික්ත 03 ක් විය. | අවශ්‍යතාවයට අනුව පුරප්පාඩු පුරවා ගැනීමට කටයුතු කළ යුතු වේ. | නැගෙනහිර පළාත්, පළාත් පාලන කොමසාරිස් මගින් කටයුතු කරනු ලැබේ. |

## 3.4 මතභේදයට තුඩුදුන් ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| එක්සත් චතුරශ්‍රයේ ගොඩනැගිලි සංකිර්ණයේ කඩ කාමර 02 ක් 2018 මාර්තු සිට සභාවේ මන්ත්‍රීවරුන් දෙදෙනකුට පනතේ 180 වගන්තියට පටහැනිව බදු දී තිබුණි. | මහා නගර සභා ආඥා පනත ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | සභාවේ මන්ත්‍රීවරුන් දෙදෙනකුට බදු දී තිබු කඩ කාමර ආපහු ලබා ගැනීටම ලිපි යවා ඇත. |

## 3.5 වත්කම් කළමනාකරණය

### 3.5.1 වත්කම් ලේඛන ගත නොකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ස්ථාවර වත්කම් ලේඛන පවත්වා නොතිබුණු අතර, තාවකාලිකව පවත්වා ගෙන ගිය ලිපිගොනුවල 2019 වර්ෂයේ වත්කම් මිලදී ගැනීම් සහ අපහරණය සම්බන්ධ තොරතුරු ඇතුළත් වී නොතිබුණි. | අදාල ලේඛන පවත්වා ගත යුතු වේ. | ඉදිරියේදි මේය නිවැරදි කරමි. |

### 3.5.2 නඩත්තු හා අළුත්වැඩියා සිදු නොකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මෝටර් වාහන සහ යන්ත්‍ර 10 ක් වර්ෂයකට වඩා වැඩි කාලයක සිට අළුත්වැඩියා කිරීමකින් තොරව පැවතුනද, ඒවා අළුත්වැඩියා කිරීමට හා ප්‍රයෝජනයට ගත නොහැකි තත්වයේ තිබූ වාහන හා යන්ත්‍ර 22 ක් අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | නිසි කටයුතු කළ යුතු වේ. | සභාවේ අළුත්වැඩියා කළ හැකි වාහන අළුත්වැඩියා කිරීමට අවසර ලබා ගැනීමටද, අළුත්වැඩියා කළ නොහැකි වාහන හඳුනාගෙන සභාවේ අනුමැතිය සමඟ වෙන්දේසි කිරීමටද පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර ඇත. |

### 3.5.3 නිෂ්ක්‍රිය / ඌණ උපයෝජිත වත්කම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ගිනි නිවීමේ අංශයේ ආරක්ෂක උපකරණ, ගිනි නිවන උපකරණ, ජල බට, සවිකිරීම් වසර දෙකකට වඩා වැඩි කාලයක් අළුත්වැඩියා නොකර තිබීමෙන් මහජන සේවය ලබා දීමට නොහැකිව තිබුණි. | මහජන සුබසාධනය සඳහා යොදවාගත යුතු වේ. | ඉදිරියේදී මෙය නිවැරදි කරමි. |
| (ආ) | කල්මුණේ සහ සායින්තමරුදු ප්‍රදේශවල ළමා වෙරළ උද්‍යාන ඉදිකිරීම සඳහා පිළිවෙලින් රු.26,780,072 සහ රු.8,267,830 ක් වැය කර තිබුණි. නමුත් ඒවා ප්‍රයෝජනයට ගෙන නොතිබීමෙන් එහි සවිකර තිබූ උපකරණ හා භාණ්ඩ අනාරක්ෂිතව පැවතුනි. | ළමා මුහුදු වෙරළ උද්‍යාන ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කර එහි සවිකර ඇති උපකරණ හා භාණ්ඩ ආරක්ෂා කිරීමට කටයුතු කළ යුතු වේ. | මෙම උද්‍යානය ඉදි කරන අවස්ථාවේ සිට එහි ආරක්ෂාව සඳහා සේවකයන් පත්කර තිබුණි. මෙහි මුහුදු පෙදෙසේ ඉදි කර තිබූ වැට වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ උපදෙස් අනුව ඉවත් කිරීම නිසා ආරක්ෂා කිරීම අසීරු කාර්යයක් විය. එහි සවිකිරීම් වලට හිතාමතා සමහර අය විසින් හානි සිදු කර තිබුණි. කෙසේවුවද, මෙම වර්ෂයේ උද්‍යානය අළුත්වැඩියා කිරීමට සභා අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත. |

### 3.6 ප්‍රසම්පාදන

### 3.6.1 ප්‍රසම්පාදන සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සැපයුම් හා සේවා සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්ම් පිළියෙල කිරීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරි කාලයේදී ප්‍රසම්පාදන සැලැස්මක් සකස්කිරීමට කටයුතු කරනු ලැබේ. |

### 3.6.2 සැපයුම් හා සේවා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2019 වර්ෂයේදී පරිගණක 05 ක් මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවා ආයතන 05 කින් මිල ගණන් ලැබී එක් ආයතනයකින් මිලදී ගෙන තිබුණි. කෙසේ වෙතත් මිල ගණන් ලබා ගත් අනෙකුත් ආයතන දීර්ඝ කාලයක සිට වසා දමා ඇති සහ පරිගනක වෙළඳාමේ නිරත නැති ආයතනයන් විය. | මිල ගණන් කැඳවීමේදි අදාල ආයතන, භාණ්ඩ බෙදාහැරීම් වල සම්බන්ධවී ඇති බව සනාථ කර ගත යුතු වේ. | මෙම මිලදී ගැනීමට අදාල මිල ගණන් ලබා ගත් ආයතන මහ නගර සභාවේ ලියාපදිංචිවී ඇති ආයතන වශයෙනුත් පළාත් සභාවේ ලියාපදිංචි පිළිබඳ සැපයීම් ලේඛනය අනුවද මිල ගණන් ඉදිරිපත් කරන ලෙස ලේඛනගත තැපැලෙන් මිල ගණන් ලබා ගෙන මිල දී ගැනීම් මාර්ග උපදේශක අනුව මෙම මිලදී ගැනීම් සිදුකර ඇත. |

## 4 ගිණුම් කටයුතු භාවය සහ යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණන

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| අභ්‍යන්තර විගණන අංශය විසින් 2019 වර්ෂය වෙනුවෙන් විගණනයක් සිදුකර නොතිබුණි. | අභ්‍යන්තර විගණනය ශක්තිමත් කළ යුතු වේ. | දැනට නිවැරදි කර අනිකුත් විගණන කටයුතු කරමින් පවතී. |

### 4.2 විගණන හා කළමනාකරණ කමිටු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය වෙනුවෙන් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි. | විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීමට කටයුතු කළ යුතු වේ. | ලබන වර්ෂයේදි ආරම්භ කිරීමට අවශ්‍ය කටයුතු කර ඇත. |

### 4.3 නොවිසඳී ඇති විගණන නිරීක්ෂණ

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | මස්කඩ බදුකුලී ඇප මුදලට අදාලව රු. 544,154 ක් වටිනා චෙක්පත් 06 ක් 2012 වර්ෂයේ බැංකුවේ තැන්පත් කිරීමෙන් පසු අගරු වී ඇතත් මේ පිළබඳව කටයුතු කර නොතිබුණි. | අගරු චෙක්පත්වලට මුදල් ලබා ගත යුතු වේ. | මේ සම්බන්ධයෙන් ප්‍රමාණවත් ලියවිලි නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | කාර්යාල ව්‍යුහය පිළිබඳ දැන්වීම් පුවරු සකස්කිරීම සඳහා 2013 වර්ෂයේදී රු. 123,000 ක ගෙවීමක් කර තිබුණද, මේ දක්වා අදාල පුවරු සවිකර නොතිබුණි. | අදාල පුවරුව සවිකිරීමට කටයුතු කළ යුතු වේ. | මේ සම්බන්ධයෙන් ඉදිරියේදී කටයුතු කරමි. |
| (ඇ) | සංවර්ධන කටයුතු ඉටු කිරීම සඳහා පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ 2009 වර්ෂයේ ලබාදුන් අරමුදල් අදාල අරමුණ සඳහා යොදවා ගැනීමකින් තොරව රු.මිලියන 03 ක් සථාවර තැන්පත් වල සහ රු.2,468,590 ක් ජංගම ගිණුමේද තැන්පත් කර තිබුණි. | ලබාදුන් අරමුදල අදාල අරමුණ සඳහා යොදවා ගැනීමට කටයුතු කළ යුතු වේ. | පළාත් සංවර්ධන වැඩ සඳහා ඉදිරියේදී ක්‍රියාත්මක කරන ව්‍යපෘති සඳහා ස්ථාවර තැන්පත්වලින් මුදල් ආපසු ලබා ගෙන උපයෝජන කිරීමට කටයුතු කරමි. |
| (ඈ) | අසභා අරමුදල් යොදවා රු.124,969 ක මුදලකට පාසල් ළමුන් සඳහා උපකරණ මිලදී ගෙන 2015 ජුනි 30 දින විද්‍යාලයකට භාරදුන් බව කීවද, එම භාණ්ඩ එම අදාල විදුහලට ලැබී නොතිබූ බව අනාවරණී විය. | මේ පිළිබඳව අවශ්‍ය කටයුතු කළ යුතු වේ. | ඉහත භාණ්ඩ අදාල විදුහල ලබාගත් බවට සාක්ෂි ඉදිරිපත් කරන ලෙසත්, එසේ ඉදිරිපත් කිරීමට අපොහොසත් වූවහොත් එම මුදල අයකිරීමට කටයුතු කරන බව හිටපු මහ නගර සභාවේ මන්ත්‍රීට ලියුම් යැවීමට කටයුතු කර ඇත. |